© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved.]



ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)

## අවසාන පරීක්ෂණය - 2019

## PE0140 (PE740) - විෂයමාලා න්‍යාය සහ භාවිතය

### II කොටස

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. විෂයමාලාව පිළිබඳ නිර්වචනය කර ගැනීම විෂයමාලා සැලසුම්කරණයට සාර්ථක මග පෙන්වීමකි.

(i) විෂයමාලා විද්වතුන් විසින් විෂයමාලාව පිළිබඳ ව ඉදිරිපත් කර ඇති නිර්වචන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ඔබ අධ්‍යයනය කර ඇති විෂයමාලාව පිළිබඳ නිර්වචන ඇසුරින් විෂයමාලාවක ඇතුළත් අංග ලක්ෂණ **පහක්** නම් කරන්න. (ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව සම්බන්ධයෙන් පවතින විවාදාත්මක මත **දෙකක්** සඳහන් කර, ඒවා කොතෙක් දුරට සාධාරණ දැ'යි හේතු සහිත ව විග්‍රහ කරන්න. (ලකුණු 07)

02. කිසියම් විෂයමාලාවක් පිළිබඳ තීරණ ගැනීමේ දී දාර්ශනික මත ඉතා වැදගත් වේ.

(i) අධ්‍යාපන දර්ශනයට මූලික වූ දාර්ශනිකයන් **හතර දෙනකු** නම් කරන්න. (ලකුණු 04)

(ii) ඔවුන්ගේ දාර්ශනික මත ආශ්‍රිත ව ගොඩනැඟුණු අධ්‍යාපන දර්ශන **හතර** සඳහන් කරන්න. (ලකුණු 05)

(iii) වර්තමානයේ දී ශ්‍රී ලංකාවට වඩාත් උචිත වනු ඇතැ'යි ඔබ අදහස් කරන්නේ කුමන අධ්‍යාපන දර්ශනය මත පදනම් වූ විෂයමාලාවක් දැ'යි කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

03. විෂයමාලා සම්පාදනයේ දී මනෝවිද්‍යාත්මක සාධක කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කළ යුතු වේ.

(i) විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියට පදනම් සපයන මනෝවිද්‍යා ගුරුකුල **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) ඔබ කැමති මනෝවිද්‍යාත්මක ගුරුකුල **දෙකක** ඉගෙනුම පිළිබඳ විග්‍රහය සන්සන්දනය කරන්න. (ලකුණු 05)

(iii) ඉහත සඳහන් කළ එක් මනෝවිද්‍යාත්මක ගුරුකුලයක මූලික සංකල්ප තුනක් ශ්‍රී ලංකාවේ විෂයමාලා සැලසුම කෙරෙහි බලපා ඇති ආකාරය නිදසුන් **තුනක්** සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 07)

අ.පි.බ.

04. විෂයමාලාව සැලසුම් කිරීමේ දී සමාජ-ආර්ථික පසුතලය පිළිබඳ ව දැඩි ව අවධානය යොමු කළ යුතු ය.

(i) විෂයමාලාව කෙරෙහි බලපාන සමාජ-ආර්ථික පදනමෙහි අංග **හතරක්** නම් කරන්න.

(ලකුණු 04)

(ii) සමාජ සංවර්ධනය සඳහා දැනුම ලබා දීමේ මූලධර්ම **දෙකක්** සඳහන් කර, ඒවායේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) විශේෂ ලැදියා කණ්ඩායම් **දෙකක්** සඳහන් කර, ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව තුළ ඔවුන් සඳහා ලැබී ඇති ඉඩකඩ කෙතෙක් ද යන්න උදාහරණ **තුනක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 07)

05. විෂයමාලා පිරිසැලසුමක මූලිකාංග යම් විෂයමාලාවක ඇතුළත් වන ස්වභාවය අනුව විවිධ විෂයමාලා ප්‍රභේද දක්නට ලැබේ.

(i) විෂයමාලා පිරිසැලසුමක මූලිකාංග **හතර** ලියන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ විෂයමාලාව තුළ හඳුනා ගත හැකි විෂයමාලා ප්‍රභේද **දෙකක්** නම් කර, උදාහරණ **දෙකක්** මගින් සනාථ කරන්න. (ලකුණු 05)

(iii) ඔබ කැමති විෂයමාලා සංවර්ධන ආකෘතියක් රූපසටහනක් ඇසුරින් ඉදිරිපත් කර පැහැදිලි කරන්න. (ලකුණු 07)

06. මයිකල් ෆුලන්ට අනුව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම යනු වෙනස් කිරීමේ ක්‍රියාවලියකි.

(i) මයිකල් ෆුලන් දක්වා ඇති ආකාරයට විෂයමාලාව ක්‍රියාත්මකවීම කෙරෙහි බලපාන වෙනසෙහි ලක්ෂණ **හතර** නම් කරන්න. (ලකුණු 04)

(ii) විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ ආකෘති **දෙකක්** සඳහන් කර, ඉන් **එකක්** පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන වෙනස්වීමේ ක්‍රියාවලිය කෙරෙහි අධ්‍යාපන පරිවර්තන කාරකයන්ගේ දායකත්වය කොතෙක් දුරට බලපා ඇත්ද? විමසන්න. (ලකුණු 07)

07. විෂයමාලා ඇගයීම, විෂයමාලාවක වටිනාකම තීරණය කිරීම සඳහාත් විෂයමාලා සංවර්ධනය සඳහාත් අත්‍යවශ්‍ය ක්‍රියාවලියකි.

(i) විෂයමාලාව ඇගයීමේ ක්‍රියාවලිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) විෂයමාලා ඇගයීමේ ක්‍රියාවලියේ අවධි **දෙකක්** නම් කර, කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iii) විෂයමාලාව ඇගයීමේ ආකෘතියක් නම් කර, එහි සුවිශේෂී ලක්ෂණ **තුනක්** ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව කෙරෙහි අවධානය යොමු කරමින් පෙන්වා දෙන්න. (ලකුණු 07)

08. ශ්‍රී ලංකාවේ විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියට විවිධ පාර්ශ්වකරුවන් සුවිශේෂ දායකත්වයක් සපයයි.

(i) ශ්‍රී ලංකාවේ විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන පාර්ශ්ව **හතරක්** නම් කරන්න.

(ලකුණු 04)

(ii) ඉන් එක් පාර්ශ්වයක දායකත්වය, පැවරී ඇති කාර්ය භාරයන් **තුනක්** ආශ්‍රිත ව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ප්‍රධාන විෂයමාලා ප්‍රතිසංස්කරණ **තුනක්** නම් කර, ඉන් **එකකින්** ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ප්‍රගමනයට ඇති කළ බලපෑම උදාහරණ **දෙකක්** ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 07)

********